
## අ.පො.ස උසස් පෙළ

# දේශපාලන විද්‍යාව



## දේශපාලන චින්තනය සහ මතවාද

## 2.2 දේශපාලන චින්තන සහ මතවාද




### දේශපාලන මතවාද අර්ථකතනය කිරීම:–

සමාජයේ දේශපාලනයට බලපෑම් කරන, දේශපාලන ක්‍රියාකාරීත්වයට හා ගමනට මග පෙන්වන, සමාජයේ විශාල ජන කොටසක් ආකර්ෂණය කර ගැනීමට සමත් වන දේශපාලන මතිමතාන්තර හා විශ්වාස ආදියෙන් සමන්විත නිශ්චිත අදහස් සමුච්චයයි.

### දේශපාලන මතවාදයක්

- එකිනෙකට සංගත අදහස් මාලාවකින් සමන්විත වේ.
- සමාජයේ යම් යම් කොටස්වල දේශපාලන විඥානය, විස්වාස සහ ඉදිරි දැක්ම හැඩගැස්වීමට ද සමත්වේ.
- සමාජ කොටස් දේශපාලන ක්‍රියාකාරීත්වයට යොමු කිරීමේ හැකියාව ද සහිත වේ.

දේශපාලන මතවාද පහත ලෙස උදාහරණ තුනක් මගින් පැහැදිලි කළ හැකි ය.

| | | |
|---|---|---|
| I. | ලිබරල්වාදය | පැහැදිලි කිරීම |
| II. | සමාජවාදය | |
| III. | ජාතකවාදය | |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## I. ලිබරල්වාදය

- මෙහි ප්‍රධානතම මූලධර්මය පෞද්ගලික නිදහස ය. පෞද්ගලික නිදහස, සමාජ නිදහසේ මුල්ගල බවත්, එය ආර්ථික, සමාජ සංස්කෘතික යන ක්ෂේත්‍රවල දී මූලික මූලධර්මය විය යුතු බවත් ලිබරල්වාදය විශ්වාස කරයි.

- යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදය බිහිවීමේ පසුබිම තුළ ලිබරල් වාදය ඓතිහාසික වශයෙන් වර්ධනය විය.

- නිදහස් වෙළඳපොළ පිළිබඳ ලිබරල්වාදී ආර්ථික මූලධර්මය "නිදහස" පිළිබඳ ලිබරල්වාදී තේරුම් ගැනීම සමග බද්ධ වී තිබුණි. දේශපාලන ක්ෂේත්‍රය ද "නිදහස්" එකක් විය යුතුය යන ලිබරල් දේශපාලන මතවාදය පසුව ප්‍රජාතන්ත්‍රවාදය සමග බද්ධ විය. **"ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය"** යන්න බිහි වූයේ ඒ වෙතිනි.

- වර්තමාන ලෝකයේ දේශපාලන ආයතන මූලධර්ම සහ භාවිතයන් හැඩගැස්වීමට ලිබරල් දේශපාලන මතවාදය ප්‍රධාන සාධකයක් වී තිබේ. එලෙස ලිබරල්වාදයේ ආභාසයෙන් ගොඩ නැගුණු ආයතන, මූලධර්ම සහ භාවිතයන් මෙසේ ය.

### ආයතන

- **පාර්ලිමේන්තුව**



- **නිදහස් අධිකරණය**



- **ජනමාධ්‍යය**



- **සීමිත බලතල සහිත ආණ්ඩුව**



Copyright © e-thaksalawa.moe.gov.lk

## මූලධර්ම

- පුද්ගල නිදහස
- බලතල වෙන් කිරීම
- සංවරණ සහ තුළන ක්‍රම
- නීතියේ ආධිපත්‍යය
- මූලික අයිතිවාසිකම්
- පෞද්ගලික දේපල අයිතිය




Copyright © e-thaksalawa.moe.gov.lk

## භාවිත

- නිදහස් මැතිවරණ
- පුරවැසි අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ රාජ්‍යයේ වගකීම
- පුද්ගල නිදහස සහතික කිරීම
- රාජ්‍යය ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයේ අවම ලෙස මැදිහත් වීම
- ආගම සහ රාජ්‍යය වෙන් කිරීම
- දේශපාලන බලයට සීමා පැමිණවීම







Copyright © e-thaksalawa.moe.gov.lk

ඉහත සඳහන් කල ආයතන මූලධර්ම සහ භාවිත අධ්‍යයනයේ පහසුව තකා පහත ආකාරයට ද දැක්විය හැකිය.

| ආයතන | මූලධර්ම | භාවිත |
| --- | --- | --- |
| • පාර්ලිමේන්තුව<br>• ජනමාධ්‍යය<br>• නිදහස් අධිකරණ<br>• සීමිත බලතල සහිත ආණ්ඩුව | ➢ පුද්ගල නිදහස<br>➢ බලතල වෙන් කිරීම<br>➢ සංවරණ හා තුළන ක්‍රම<br>➢ නීතියේ ආධිපත්‍ය<br>➢ මූලික අයිතවාසිකම්<br>➢ පෞද්ගලික දේපළ අයිතිය | ▪ නිදහස් මැතිවරණ<br>▪ පුරවැසි අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ රාජ්‍යයේ වගකීම<br>▪ පුද්ගල නිදහස සහතික කිරීම<br>▪ රාජ්‍යය ආර්ථික සහ සමාජ ක්ෂේත්‍රයේ අවම ලෙස මැදිහත් වීම<br>▪ ආගම සහ රාජ්‍යය වෙන් කිරීම<br>▪ දේශපාලන බලයට සීමා පැමිණවීම |

## II. සමාජවාදය

- ➢ 19 සියවසේ දෙවන භාගයේ ආරම්භ වූ සමාජවාදය 20 වැනි සයවසේ ද ප්‍රබල දේශපාලන මතවාදයක් ලෙස පැතිරිණි. එය බිහිවූයේ ලිබරල්වාදයට හා ධනවාදයට විවේචනයක් මෙන් ම විකල්පයක් ද වශයෙනි.

- ➢ 19 වන සියවසේ මුල් අවධියේ යුරොපයේ ඇති වූ කාර්මික විප්ලවයක් සමඟ ඇතිව තිබූ සමාජ ආර්ථික විෂමතා ඉදිරියේ, සමාජවාදයෙන් ඉදිරිපත් වූ ප්‍රධාන අදහස නම් සමාජ සමානාත්මතාව සහ දේපලවල පොදු සමාජීය අයිතිය වේ.


Copyright © e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for The General Education

- කාර්මික විප්ලවය ඇති වූ යුරෝපා රටවල් කිහිපයක් ලෙස ප්‍රංශය, ජර්මනිය, බ්‍රිතාන්‍ය දැක්විය හැකිය

- සමාජවාදයෙන් ඉදිරිපත් වූ ප්‍රධාන අදහස වන සමාජ සමානත්වය සහ දේපල වල පොදු සමාජයීය අයිතිය යන අදහස තව දුරටත් වර්ධනය වෙමින් **"සමාජවාදය"** යන්න ප්‍රබල මතවාදයක් බවට පත් කරන ලද්දේ **මාක්ස්වාදය** විසිනි.

- සමාජවාදය පිළිබඳ ව මාක්ස්වාදය ඉදිරිපත් කළ ප්‍රධාන ප්‍රවාදය වුයේ, සැබෑ සමාජවාදය ඇති කළ හැක්කේ ධනවාදී ක්‍රමය පෙරළා දමා කම්කරු පන්තිය, පාලක පන්තිය බවට පත් කරන සමාජවාදී විප්ලවයකින්ය යන්නයි.

### ❖ 20 වන සියවසේ දේශපාලනය සම්බන්ධයෙන් සමාජවාදය ප්‍රධාන කාර්යන් 04 ක් ඉටු කරන ලදී.



නිදහස, සමානාත්මතාවය සහ සමාජ දේශපාලන විමුක්තිය පිළිපද ලිබරල්වාදී මතවාදයට ප්‍රභල විකල්පයක් ගොඩ නැගීම.

2. ධනවාදී දේශපාලන ක්‍රමයට විකල්ප වශයෙන් සමාජවාදී රාජ්‍යය පිළිබඳ ඉදිරි දැක්මක් ඉදිරිපත් කිරීම.

3. ධනවාදය හා බැඳුණු සූරාකෑම, සමාජ පීඩනය හා සමාජ අසමානතාව පිළිබඳ ව දැඩි විවේචනයක් ඉදිරිපත් කරමින්, පීඩිත ජන කොටස්වල සමානත්වය, අයිතිවාසිකම් හා සමාජ විමුක්තිය පිළිබඳ තේමාව දේශපාලන චින්තනයේ කේන්ද්‍රය වෙතට ගෙන ඒම.


4. යුරෝපීය මෙන්ම යුරෝපීය නොවන ලෝකයේ ද සමාජ/දේශපාලන නිදහස සඳහා වූ බහුජන ව්‍යාපාර වලට මග පෙන් වූ ප්‍රබල දේශපාලන මතවාදයක් වීම

## III. ජාතිකවාදය

- දහවෙනි සියවසේ පටන් ලෝකය පුරා පැවතුණු ප්‍රබලතම මතවාදයකි.


- පළමුවන් යුරෝපයෙන් මතු විය. පසුව ආසියානු, අප්‍රිකානු, ලතින් ඇමරිකානු රටවල දේශපාලන මතවාදයක් බවට පත් විය.


Copyright © e-thaksalawa.moe.gov.lk




## ජාතිකවාදය ඉටු කර ඇති සහ තවමත් ඉටු කරන කාර්යය

01. රාජ්‍යයක් ලෙසට සංවිධානය විය හැකි පොදු අනන්‍යතාවක් ඇති දේශපාලන ප්‍රජාවක් ලෙසට තමන් ගැනම පරිකල්පනය කිරීමේ මතවාදීය හා සංකල්පීය රාමුව ප්‍රජාවන්ට සපයන්නේ ජාතිකවාදයයි.



02. නූතන ජාතික රාජ්‍යය මූලික වශයෙන් හැඩගැසී තිබෙන්නේ ජාතිකවාදය විසින් **ජාතිය හා රාජ්‍යය** පරිකල්පනය කර ඇති ආකාරය අනුව ය. ජාතිවාදී දේශපාලනයේ විවධ ප්‍රකාශනයන් ලෙස නූතන ජාතික රාජ්‍යයේ පදනම්වාදී මූලධර්ම හැඩගැසී තිබේ.

**නූතන ජාතික රාජ්‍යයේ පදනම්වාදී මූලධර්ම**

- භෞමික ඒකාග්‍රතාවය
- සංස්කෘතික ඒකියත්වය
- ජාතිය හා රාජ්‍යය එකට සමපාත විය යුතුය


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk